සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 6.2.2. මයිකල් ආන්ජිලෝගේ ශිල්පියාගේ නිර්මාණ අගයමු**

1. ඉගෙනුම් අත්වැල

**මයිකල් ආන්ජිලෝ**

- ක්‍රි.ව. 1475 ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ කාසල් කැප්රීස් නම් ස්ථානයේ දී උපත ලැබී ය.
- ඔහු චිත්‍ර, මූර්ති හා කැටයම් කලාව හා වාස්තු විද්‍යාව සඳහා සහජ දක්ෂතාවක් දැක්වූ අතර පුබුදු යුගයේ බිහි වූ විශිෂ්ට කලා ශිල්පියෙකු ලෙසින් හැඳින්විය හැකි ය.
- මයිකල් ආන්ජිලෝ ශිල්පියා සිස්ටයින් දෙව්මැදුරේ අඳින ලද සිතුවම්වලට අමතරව ශුද්ධ වූ පවුල නමින් කැන්වසය මත තෙල් සායම් මාධ්‍ය සිතුවමක් ද නිර්මාණය කර තිබේ.

කිරිගරුඬ මාධ්‍යයෙන් කරන ලද විශිෂ්ට මූර්ති

- පියෙටා
- ඩේවිඩ්
- මෝසෙස්
- මියයන වහලා
- කැරලිකාර වහලා
- II වැනි ජුලියස් පාප්තුමාගේ සොහොන් ගෙය
- බෘගස්හි මරිය මව්තුමිය


පියෙටා


අන්තිම විනිශ්චය


ඩේවිඩ්


ආදම් මැවීම

**පියෙටා**

- කුරුසියෙන් ඉවත් කරන ලද මිය ගිය ජේසුස් වහන්සේගේ අප්‍රාණික සිරුර මරිය මව්තුමිය විසින් උකුලෙහි හොවාගෙන සිටින ආකාරයයි.
- කිරිගරුඬ මාධ්‍යයෙන් නෙළා ඇති මෙය පූර්ණ උන්නත මූර්තියකි.
- රෝමයේ ශාන්ත පීතර දෙව් මැඳුරේ ප්‍රදර්ශනය කර ඇත.
- ජේසුස් වහන්සේගේ අප්‍රාණික ශරීර ස්වභාවය තාත්විකව හා මරියතුමියගේ සළුපිළිවල රිද්මයානුකූල බව ඉතා ස්වභාවිකව කිරිගරුඬ මාධ්‍යයෙන් නිරූපණය කර ඇත.
- මව සහ පුතු සමවයස්ව දැක්වීමෙන් දිව්‍යමය ස්වභාවය මතුකිරීමට උත්සාහයක් දරා ඇත.
- මානුෂිකත්වය පිළිබඳ අනුවේදනීයත්වය මෙම නිර්මාණයෙන් ධ්වනිත කරයි.

2. ක්‍රියාකාරකම

ලබා දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1) මයිකල් ආන්ජිලෝ ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2) මයිකල් ආන්ජිලෝගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

3) පහත දී ඇති සිතුවම හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න



- හඳුනාගත් බව : ...............................................
- ශිල්පියා : ...............................................
- ශිල්ප ක්‍රමය : ...............................................
- මාධ්‍ය : ...............................................
- ශිල්පීය කුසලතා : ...............................................

3. ඇගයීම

1) මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්න.

2) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන වගු ගත කරන්න.

3) මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ ප්‍රධාන මූර්ති 3ක් ගෙන හඳුනාලත් බව, ශිල්ප ක්‍රමය, මාධ්‍ය හා ශිල්පීය කුසලතා යන උප මාතෘකා ඔස්සේ කෙටි හැඳින්වීමක් කරන්න